**රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2021**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මතය

**--------**

රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**-----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

-------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව<br>------------------ | අනුකූල නොවීම<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>---------------------------- | නිර්දේශය<br>-------------- |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 134(3) | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක විසින් සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | 2020 වර්ෂයට අදාලව 2021 වර්ෂයේ දී වෘත්තීය තක්ෂණ විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණනයක් සිදුකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකල යුතුය. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගතවීමට පෙර සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු වුවත්, විද්‍යායතනය ආරම්භ කළ 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික වාර්ථාව පිළියෙලකර ඉදිරියේදී විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2014 පෙබරවාරි 10 දිනැති අංක DMS/1670 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | (i) සමාලෝචිත වර්ෂය තුළ දී බාහිර කථිකාචාර්ය හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා ගාස්තු ලෙස රු. 411,695 ක් ද සිසුන් බඳවාගැනීම සඳහා පැවැත්වූ විභාග සඳහා රු. 129,190 ක් ද චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව ගෙවා තිබුණි. | අනුමැතිය ඉල්ලා කිහිපවිටක් අමාත්‍යාංශය වෙත, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණද මෙතෙක් අනුමැතියක් ලබාදී නොමැත. ක්‍රියාකාරකම් ප්‍රමාදයකින් තොරව පවත්වාගෙන යාම සඳහා දැනට පවතින DMS 1670 අනුව ගෙවීම් කටයුතු සිදුකරනු ලැබේ. | විධිමත් අනුමැතියක් ලබා ගෙන ගෙවීම් සිදුකිරීමට කටයුතු කල යුතුය. |
| | | (ii) චක්‍රලේඛ ප්‍රතිපාදන නොමැති විභාග කටයුතු, පන්ති සකස් කිරීම්, අධීක්ෂණ කටයුතු හා සහායක ගෙවීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුළ රු.292,750 ක් ගෙවා තිබුණි. | මෙම ශිෂ්‍ය බඳවාගැනීමේ විභාග කටයුතු වෙනුවෙන් ශිෂ්‍යයින්ගෙන් රු.500 බැගින් වූ අයදුම්පත් ගාස්තුවක් අය කරන අතර එම මුදල් මෙම විභාග කටයුතු සඳහා භාවිතාකරනු ලැබේ. DMS 1670 සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව ගෙවීම් කටයුතු සිදුකර ඇත. | විධිමත් අනුමැතියක් ලබා ගෙන ගෙවීම් කටයුතු සිදු කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදුකල අතර එහිදී හදුනාගත් අඩුපාඩු නිවැරදි කරමින් මෙම වර්ෂය තුල භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීමට සැලසුම් කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 768,653 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 3,904,668 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,673,321 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවා වියදම රු.5,060,207 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනය ආරම්භ කළ 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම විද්‍යායතනය පිහිටා තිබූ හෙක්ටයාර 0.427 ක් වූ භූමි ප්‍රමාණය නීත්‍යානුකූලව පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි. | ඉඩම පවරාගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත්කර ඇති අතර මෙතෙක් ඒ සඳහා ක්‍රියාමර්ගයක් ගෙන නොමැත. | ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදුකල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනය විසින් පවත්වාගෙන යන පාඨමාලා සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලයේ කථිකාචාර්යවරු දෙදෙනෙකු සඳහා පමණක් පුරප්පාඩු තිබියදී බාහිර කථිකාචාර්යවරුන් 35 දෙනෙකු බඳවාගෙන ඔවුන් වෙනුවෙන් 2020 හා 2021 වර්ෂ සඳහා පිළිවෙලින් රු. 621,555 ක හා රු. 1,046,950 ක දීමනා ගෙවා තිබුණද වර්ෂය තුළදී පවත්වන ලද පාඨමාලා 10 ට අදාළව නිකුත් කරන ලද විභාග ප්‍රතිඵල අනුව සිසුන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය සියයට 12.5 සිට සියයට 74 දක්වා අඩු පරාසයක පැවතුණි. | රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය තුල සියලු පාඨමාලා පැවැත්වෙන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. තවද සංකීර්ණ විෂයන්ද පාඨමාලා අන්තර්ගතයන් තුල ඇතුලත්වේ. සංකීර්ණ විෂයන් ඉංග්‍රීසි භාෂාවෙන් උගන්වා ඉහල ප්‍රතිඵල බලපොරොත්තු විය නොහැකි බව ප්‍රධානතම හේතුව වන අතර මෙම තත්වයට විසඳුම් ලෙස සිසුන් ඇතුලත්කර ගැනීමේදී සුදුසුකම් වෙනස්කිරීමට මෙන්ම සිසුන්ට ගැලපෙන ආකාරයෙන් විෂයමාලා සංශෝධනය කිරීමටද මේ වනවිට අධ්‍යයන කාර්ය මණ්ඩලය ක්‍රියාත්මක වෙමින් සිටී. | පාඨමාලා ආරම්භයට පෙර ඉංග්‍රීසි පාඨමාලාවක් පවත්වා සිසුන්ගේ සමත්වීමේ ප්‍රතිශතය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |